සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ (“සමාගම”)2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක: 01/2021, රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත			
	i. 3.1 (i) වගන්තිය	සියලුම රාජ්‍ය ව්‍යවසායන් තම සේවක සංඛ්‍යාව සහ වේතනයන් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවට අනුකූලව කටයුතු කර නොතිබුණි	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම විසින් ලංකා විදුලි පුද්ගලික සමාගමේ සහ සීමාසහිත ඇන්ටි මීටර් සමූහය හි අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයෙන්, සේවක තනතුරු සහ වේතනයන් අනුමත කරගෙන ඇත. කෙසේ වෙතත්, 3.1 වගන්තිය සහ 3.2 (i) වගන්ති යටතේ සඳහන් කර ඇති කරුණු ඉදිරියේදී සලකා බැලීමට කටයුතු කරණු ඇත	සේවක සංඛ්‍යාව සහ වේතනයන් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය
	ii. 3.2 (ii) වගන්තිය	සියලුම රාජ්‍ය ව්‍යවසායන්, සේවක තනතුරු, බඳවා ගැනීමේ පටිපාටිය , වැටුප් ව්‍යුහය සහ දීමනා වලට අදාළ ඉල්ලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම විසින් ලංකා විදුලි පුද්ගලික සමාගමේ සහ සීමාසහිත ඇන්ටි මීටර් සමූහය හි අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයෙන්, සේවක තනතුරු සහ වේතනයන් අනුමත කරගෙන ඇත. කෙසේ වෙතත්, 3.1 වගන්තිය සහ 3.2 (i) වගන්තිය යටතේ සඳහන් කර ඇති කරුණු ඉදිරියේදී සලකා බැලීමට කටයුතු කරණු ඇත.	සේවක තනතුරු, බඳවා ගැනීමේ පටිපාටිය, වැටුප් ව්‍යුහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළ සියලු ඉල්ලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව, අවශ්‍ය අනුමැතිය

		අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.		සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.
iii.	6.6 වගන්තිය	මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු මාස පහක් (5) ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ආරම්භයේ සිටම වාර්ෂික වාර්තාව සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමහි මූල්‍ය වාර්තා, ලංකා විදුලි පුද්ගලික සමාගමේ ඒකාබද්ධ මූල්‍ය වාර්තා වල ඇතුලත් කර ඇති බැවින්, සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම විසින් වෙනම වාර්ෂික වාර්තාවක් සකස් කර නොමැත. සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම සඳහා වෙනම වාර්ෂික වාර්තාවක් සකස් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බැලීමට කටයුතු කරණු ඇත.	ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුකූලව, මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස පහක් (5) ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.
iv.	7.1 , 7.2 හා 7.3 වගන්තිය	ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනාගෙන තිබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මට සහ අයවැයට එරෙහිව ප්‍රධාන කාර්ය සාධන දර්ශක වරින් වර සමාලෝචනය කළ යුතු අතර එමගින් සැබෑ කාර්ය සාධනය අපේක්ෂිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක සමඟ අනුකූල වන බව සහතික කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින බැවින් සහ කර්මාන්තශාලාවේ විධායක කාර්ය මණ්ඩල සංඛ්‍යාව පුද්ගලයින් 6 දෙනෙකු පමණක් වන බැවින්, වෙනම ප්‍රධාන කාර්ය සාධන දර්ශක යෝජනා ක්‍රමයක් හඳුන්වා දී නොමැත. කෙසේ වෙතත්, සෑම අංශයක් සඳහාම වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලබන අතර, එම ක්‍රියාමාර්ගවල වගකීම විධායක මට්ටමේ වගකිවයුතු පුද්ගලයින් වෙත පවරනු ලබන අතර ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය, වාර්ෂිකව මෙන්ම කළමනාකරණ සමාලෝචන රැස්වීම් අතරතුරද සමාලෝචනය කෙරේ. සියලුම සේවකයින් සඳහා, පූර්වනිශ්චිත නිර්ණායක සමූහයක් මත පදනම්ව වාර්ෂික ඇගයීම් සිදු කරනු ලබන අතර, ඉදිරියේදී විධායක කාර්ය මණ්ඩලය සඳහා, වාර්ෂික	ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනා ගැනීමට පියවර ගත යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක වරින් වර සමාලෝචනය කර, ඒවා අනුමත ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සමඟ සංසන්දනය කරීම මගින් සැබෑ කාර්ය සාධනය අපේක්ෂිත ප්‍රතිඵල සමඟ සමපාත වන බවට සහතික කළ යුතුය.

			ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් අංශය සඳහා සකසා ඇති ක්‍රියාමාර්ග අනුව කාර්ය සාධන ඇගයීම සිදු කරනු ලබන අතර ප්‍රධාන කාර්ය සාධන දර්ශක යෝජනා ක්‍රමයකට සමානව ඔවුන්ගේ දායකත්වය අගය කිරීමට කටයුතු කරනු ඇත	
	v. 7.5 වගන්තිය	රාජ්‍ය සතු ව්‍යවසායන් විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.	සමාගමේ කාර්ය සාධනය නිෂ්පාදන ප්‍රමාණයන් අනුව මැනිය හැකි අතර එය ඩිජිටල් ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබේ. අදාළ ආයතන වෙත මාසික නිෂ්පාදන වාර්තාද අවශ්‍ය පරිදි ඉදිරිපත් කළ හැකිය.	මාසික, කාර්තුමය සහ වාර්ෂික, කාර්ය සාධන වාර්තා කාලෝචිත ආකාරයකින් රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට යොමු කිරීමට පියවර ගත යුතුය.
(ආ)	මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක: 01/2021, රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනයන් පිළිබඳ මාර්ගෝපදේශය	පරිපාලිත සමාගම් විසින් උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය මව් සමාගමට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම සහ මව් සමාගමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	වර්තමානයේ ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය සකස් කර ඇති අතර, සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කර ඇත. සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම, ලංකා විදුලි පුද්ගලික සමාගමෙහි අනුබද්ධිත ආයතනයක් බැවින් මෙම ලේඛන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටියක් නොමැත.	ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ උපායමාර්ගික සැලැස්ම, රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු වේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තු වේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අදාළ පරිදි යොමු කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය	වසර පහකට වැඩි කාලයක සිට පැවැතෙන රුපියල් 12,431,380 ක් වන ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට	සමාගම සහ අප සමාගමේ බදු උපදේශක විසින් මෙම වගකීම අවම කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ පැවැති සාකච්ඡා මත, ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගෙවිය යුතු රු. 12,431,380 ක මුදල ගෙවා නොමැත. දේශීය ආදායම්	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ට ගෙවිය යුතු හිඟ ජාතිය ගොඩනැගීමේ බදු තවදුරටත් ප්‍රමාදයකින් තොරව පියවීමට

ගෙවීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ ලිඛිත දැනුම්දීමක් ලබාගෙන ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල 2025 අගෝස්තු 30 වන දිනට පෙර ගෙවීමට කටයුතු කරනු ඇත.	පියවර ගත යුතු අතර, අනාගත ගෙවීම්වල එවැනි දීර්ඝ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 499.4 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රුපියල් මිලියන 470.1 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 29.3 හෝ සියයට 6.23 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රුපියල් මිලියන 93.1 කින් පහල යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි ආදායම සියයට 26.8 කින් වැඩි වී ඇති අතර විකුණුම් පිරිවැය සියයට 35.2 කින් වැඩි වී ඇත.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයයෙහි අනෙකුත් මෙහෙයුම් ආදායම් සියයට 7.9 කින් අඩු වී තිබුණි. මෙම පිරිහීමට අබලි ද්‍රව්‍ය අලෙවිය පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි..

(ඇ) සමාගමේ මූල්‍ය ආදායම පොලී අනුපාත අඩු වීමත් සමග ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 56.4 කින් අඩු වී තිබූ අතර ශුද්ධ මූල්‍ය ආදායමද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 67.1 කින් අඩු වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ ශුද්ධ ලාභ / (අලාභ) අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 11.8 සිට සියයට 10.2 දක්වා අඩු වී තිබුණි. ජංගම අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1.7 : 1 සිට 2.2 : 1 දක්වා වැඩි වී තිබුණි.

(ආ) ස්කන්ධ මත ප්‍රතිලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 43.7 සිට සියයට 32.1 දක්වා අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට රුපියල් 349,104,413 ක් වන දේපළ පිරියත සහ උපකරණ වල භෞතික සත්‍යාපනය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.	සමාගම 2024 වර්ෂය සඳහා දේපළ පිරියත සහ උපකරණ සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නැත. සමාගම මේ පිළිබඳව මව් සමාගම වන ලංකා විදුලි පුද්ගලික සමාගම සමඟ සාකච්ඡා කර ඇති අතර 2025 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරනු ඇත.	මූල්‍ය වර්ෂය අවසානයේ දී දේපළ, පිරියත සහ උපකරණ සඳහා, වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කිරීමට පියවර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.4 වගන්තියට අනුව, රාජ්‍ය ව්‍යවසායන් සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු අතර විගණන කමිටුව හරහා මණ්ඩලයට පමණක් වාර්තා කල යුතුය. කෙසේ වෙතත්, සමාගම අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැති බව නිරීක්ෂණය විය.	වර්තමානයේ ලංකා විදුලි පුද්ගලික සමාගමේ අභ්‍යන්තර විගණන කණ්ඩායම ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම හි අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කරන අතර ඔවුන් 2023 කාර්තුවේ 4 සිට අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරන අතර විගණනය කාර්තුමය ආකාරයෙන් සිදු කෙරේ.	රාජ්‍ය ව්‍යවසාය සඳහා විගණන කමිටුව හරහා මණ්ඩලයට පමණක් වාර්තා කරන සහතික කිරීමට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට පියවර ගත යුතුය.

4.2 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වුවද, සමාගම විසින් තිරසාර සංවර්ධන අරමුණු සහ සාක්ෂාත් කරගත යුතු ඉලක්ක සහ ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි.	සමාගම තිරසාර සංවර්ධන අරමුණු තුනකට (03) කට අනුකූල වීමට පියවර ගෙන ඇත. • SDG 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සහ ගැහැණු ළමයින් බලගැන්වීම. • SDG 7 - දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය • SDG 12 - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සහතික කිරීම	සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය.